SC

# පූර්ව ආපදා තොරතුරු දැනුම් දීමේ ක්‍රියාවලියේදී ශ්‍රී ලාංකික ජනමාධ්‍යයන්හි භූමිකාව පිළිබඳ සමාජ සන්නිවේදනාත්මක අධ්‍යයනයක්

මැදෝ කන්දගේ ගයාදිනී ඉමේෂා ධර්මසේන
FGS/M/MSSC/2005/23

සමාජීය විද්‍යාපති (ජනසන්නිවේදනය) උපාධිය
සඳහා ඉදිරිපත් කරන ලදී.

කැලණිය විශ්වවිද්‍යාලය

ප්‍රවේශ අංකය 655
වර්ග අංකය

2009 අගෝස්තු

# නිබන්ධ සාරාංශය

මෙම පර්යේෂණය මගින් ''ශ්‍රී ලංකාව තුළ ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන පූර්ව ආපදා අනතුරු ඇඟවීම සඳහා තොරතුරු දැනුම් දීමේ ක්‍රියාවලියේ දී මෙරට විද්‍යුත් ජනමාධ්‍යයන් හි භූමිකාව'' කුමක් ද? යන පර්යේෂණ ගැටලුව පිළිබඳ අධ්‍යයනය කරන ලදී. ඒ සඳහා ප්‍රධාන අරමුණ ලෙසින් යොදා ගත්තේ ''ශ්‍රී ලංකාව තුළ ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන පූර්ව ආපදා අනතුරු ඇඟවීම සඳහා තොරතුරු දැනුම් දීමේ ක්‍රියාවලියෙහි විද්‍යුත් මාධ්‍ය භූමිකාව හඳුනා ගැනීම'' යන්නයි. මෙහි දී අනු අරමුණු කිහිපයක් ද සම්බන්ධ කර ගන්නා ලදී. ඉහත පර්යේෂණ ගැටලුව පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කිරීමට උපන්‍යාසය ලෙසින් ''ශ්‍රී ලංකාව තුළ ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන පූර්ව ආපදා අනතුරු ඇඟවීම සඳහා තොරතුරු දැනුම් දීමේ ක්‍රියාවලිය තුළ මෙරට විද්‍යුත් මාධ්‍යයන්ට සුවිශේෂි භූමිකාවක් ඉටු කළ හැකිය.'' යන්න යොදා ගෙන ඇත.

මෙහි දී කණ්ඩායම් තුනක් ඇසුරින් දත්ත රැස් කරන ලදී. එනම්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, විද්‍යුත් ජනමාධ්‍යයන් සහ ප්‍රජාව යන කණ්ඩායම් ය. මෙහි දී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්, විද්‍යුත් ජනමාධ්‍යවේදීන් මෙන්ම 2004 සුනාමි ව්‍යසනයට ලක් වූ දකුණු පළාතේ ප්‍රජාව අතරින් අහඹු ලෙසින් තෝරාගත් පිරිසක් පර්යේෂණය සඳහා දායක කර ගන්නා ලදී. දත්ත රැස් කිරීමේ ක්‍රම ශිල්ප දෙකක් භාවිත කිරීම ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පූර්ව ආපදා අනතුරු ඇඟවීම සඳහා තොරතුරු දැනුම් දීමේ ක්‍රියාවලියෙහි විද්‍යුත් මාධ්‍ය භූමිකාව පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමෙහිලා මනා ආනුභාවික පදනමක් සපයන ලදී. පූර්ව ආපදා අනතුරු ඇඟවීම් සඳහා තොරතුරු දැනුම් දීමේ ජාතික මට්ටමින් ක්‍රියාත්මක ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා සහ එකී ක්‍රියාවලිය තුළ මෙරට විද්‍යුත් ජනමාධ්‍යයන්හි භූමිකාව අධ්‍යයනය කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්ගෙන් අහඹු ලෙස තෝරාගත් පිරිසක් සමඟ ගැඹුරු සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබීය. එමෙන්ම පූර්ව ආපදා තොරතුරු දැනුම් දීමේ ක්‍රියාවලිය පිළිබඳ විද්‍යුත් මාධ්‍යවේදීන් තුළ ඇති දැනුවත්භාවය සහ මෙරට විද්‍යුත් මාධ්‍ය ආයතන පූර්ව ආපදා තොරතුරු දැනුම් දීම සඳහා දක්වන දායකත්වය විමර්ශනය කිරීම උදෙසා මෙරට සිංහල භාෂාවෙන් ක්‍රියාත්මක විද්‍යුත් මාධ්‍ය නාලිකාවල (රජයේ / පෞද්ගලික) ප්‍රවෘත්ති සංස්කාරකවරුන් සහ ප්‍රවෘත්ති වාර්තාකරුවන්ගෙන් අහඹු ලෙස තෝරාගත් නියැදියකින්,

පර්යේෂකයා විසින් පුරවාගත් ප්‍රශ්නාවලි (Self - Administered) ක්‍රමවේදය ඇසුරින් දත්ත රැස් කරන ලදී. 2004 සුනාමි ව්‍යසනයට ලක් වූ දකුණු පළාතේ ප්‍රජාව අතරින් අහඹු ලෙස තෝරාගත් නියදි දෙකක් වෙත යොමු කළ, පර්යේෂකයා විසින් පුරවා ගන්නා ලද ප්‍රශ්නාවලි දෙකක් ඇසුරින් ඔවුන් ආපදා අවස්ථාවක දී විද්‍යුත් ජනමාධ්‍යයන්ගෙන් අපේක්ෂා කරන්නේ කුමක් ද ? යන්නත් එම ප්‍රජාවගේ ජනමාධ්‍ය භාවිතය පිළිබඳවත් අධ්‍යයනය කළ හැකි විය. මේ ආකාරයට රැස් කළ දත්ත විස්තරාත්මකව විශ්ලේෂණයට ලක් කිරීමෙන් එළඹි ප්‍රධාන නිගමන මෙසේ ඉදිරිපත් කළ හැකිය.

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක පූර්ව ආපදා අනතුරු ඇඟවීම සඳහා තොරතුරු දැනුම් දීමේ ක්‍රියාවලිය තුළ ප්‍රධාන භූමිකාවක්, විද්‍යුත් ජනමාධ්‍යයන්ට ඉටු කළ හැකිය. එකී භූමිකාවට නිවැරදි තොරතුරු, ක්ෂණිකව, නිසි වේලාවට ප්‍රජාව තුළ අනවශ්‍ය බියක් ඇති නොවන ලෙසින් ඉදිරිපත් කිරීම යන මූලික කරුණු අන්තර්ගතවේ. වර්තමානයේ දී විද්‍යුත් ජනමාධ්‍යවේදීන් සහ විද්‍යුත් ජනමාධ්‍ය ආයතන තුළ පූර්ව ආපදා තොරතුරු සන්නිවේදනය පිළිබඳ දැනුවත් බවක් මෙන්ම අවශ්‍යතාවයක්ද පවතී. ප්‍රජාව මෙරට විද්‍යුත් ජනමාධ්‍යයන්ගෙන් ආපදා අවස්ථාවකට පූර්වයෙන් අනතුරු ඇඟවීම සඳහා තොරතුරු විකාශනය කරනු ඇතැයි යන්න විශ්වාස කරයි. පූර්ව ආපදා තොරතුරු දැනුම් දෙන ක්‍රමවේදයක් ලෙසින් විද්‍යුත් ජනමාධ්‍යය මේ වන විට විශාල ජනප්‍රසාදයක් අත්කරගෙන ඇත. එමෙන්ම 2004 සුනාමි ව්‍යසනය අවස්ථාවට සාපේක්ෂව වර්තමානය වන විට මෙරට පූර්ව ආපදා තොරතුරු දැනුම් දීමේ ක්‍රියාවලිය දියුණු තත්ත්වයක පවතී.

26 AUG 2011